කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය - 2019

----------------------------------------------------------------

**1.1** තත්ත්වාගණනය කළ මතය

------------------------------

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **16 (1)** උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යූහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු පාඨමාලා ගාස්තුවල හානිකරණ අගය ලෙස රු. 24,775,292 ක් ආදායමට ලියා හැර තිබුණද එකී හානිකරණ අගය ගණනය කිරීම් විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර මෙකී ලියා හැරීම සඳහා පාලක සභා අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | පාඨමාලා හැර ගිය සිසුන්ගෙන් අයවිය යුතු හිඟ මුදල් කළමනාකරණ මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව කපාහරින ලදී. මේ පිළිබඳව ඉදිරි කළමනාකරණ මණ්ඩල රැස්වීමට වාර්තා කිරීමට පියවර ගනු ලැබේ. | විධිමත් අනුමැතිය ලබා ගැනීමෙන් පසු ලියා හැරීම සිදුකළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ පෞද්ගලික සමාගමක විධායක නිලධාරීන් වෙනුවෙන් පවත්වනු ලැබූ පාඨමාලාවක් | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. අදාළ දෝෂය ඉදිරි මූල්‍ය වර්ෂයේදී නිවැරදි කොට | ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| සඳහා පාඨමාලා ගාස්තු අයකර තිබියදී රු. **878,125** ක් වූ ලැබිය යුතු පාඨමාලා ගාස්තු ලෙස **2019** දෙසැම්බර් **31** දිනට ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ. | |
| (ඇ) සමාලෝචිත වර්ෂය තුළ මිලදීගෙන තිබුණු එකතුව රු. **786,888** ක් උපාධි ලෝගු සහ කාර්යාල උපකරණ ප්‍රාග්ධනිත කිරීම වෙනුවට පුනරාවර්තන වියදම් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ලාභයට එරෙහිව කපා හැර තිබුණි. | උපාධි ලෝගු මිලදී ගැනීම වර්ගීකරණ දෝෂයක් නිසා ප්‍රාග්ධනගත වී නොමැත. රු. **198,150 /-** කට මිලට ගත් පරිගණක උපාංගවල ජීව කාලය සැලකිල්ලට ගෙන එය අයභාර වියදම් ලෙස ගිණුම්ගත කර ඇත. | ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් නිවැරදිව වර්ගීකරණය කළ යුතුය. |
| (ඈ)පෞද්ගලික සමාගමක විධායක නිලධාරීන් වෙනුවෙන් **2019** නොවැම්බර් **26** දින සිට **2020** ජුනි **30** දක්වා පැවැත් වූ පාඨමාලාවක් සඳහා ඉදිරි වර්ෂය වෙනුවෙන් අයවිය යුතු රු. **1,653,857** ක මුදල සමාලෝචිත වර්ෂය තුළදී දෝෂ සහගත ලෙස වර්ෂයේ පාඨමාලා ආදායමෙන් අඩුකර ඉදිරියට ලැබූ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. මෙම නිසා වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. අදාළ දෝෂය ඉදිරි මූල්‍ය වර්ෂයේදී නිවැරදි කොට ඉදිරිපත් කිරීමට පියවර ගනු ලැබේ. | ලැබිය යුතු ආදායම හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6** **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීතිනීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි **371 (2)** (ආ) හා **2015** ජූලි **14** දිනැති අංක **3/2015** දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | තත්කාර්ය අත්තිකාරම් ලබා දිය හැකි උපරිම සීමාව වන රු. **100,000** ඉක්මවා නිලධාරීන් දෙදෙනෙකුට අවස්ථා **02** කදී එකතුව රු. **295,000** ක අත්තිකාරම් ලබාදී තිබුණි. | මුදලින් අත්තිකාරම් ලබා දෙනුයේ අත්‍යාවශ්‍යම අවස්ථාවල පමණි. අත්තිකාරම් අවශ්‍ය කාර්ය අනුව මුදල් රෙගුලාසිවල සඳහන් සීමාව ඉකුත් වීම ද සිදුවේ. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව විය යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (ii)මුදල් රෙගුලාසි 371 (5) හා 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ලබාගත් තත්ත්කාර්ය අත්තිකාරම් අදාල කාර්යය නිමකල විගස හෝ දින දහයක් ඇතුළත පියවිය යුතු වුවද අවස්ථා 10 කදී ලබාදී තිබූ එකතුව රු. 740,016 ක් වූ අත්තිකාරම් ආපසු පියවීම දින 15 සිට දින 224 අතර කාල පරාසයක් ප්‍රමාද වී තිබුණි. | ලබාගත් අත්තිකාරම් මුදල්වලින් ඉතිරි වූ ශේෂයන් ප්‍රමාදයකින් තොරව පියවා ඇත. අත්තිකාරම් පියවීමට අදාළ ජර්නල් සටහන් යෙදීමේදී බොහෝ විට ප්‍රමාදයන් සිදුවන අතර එම ප්‍රමාදයන් අවම කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව විය යුතු ය. |
| (ආ) 1985 අංක 3 දරන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 11 වගන්තිය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහයේ 3 පරිච්ඡේදයේ 26 වගන්තිය | ආයතනයේ අධ්‍යක්ෂකවරයා අවම පිරිවැයකින් උපරිම කාර්යසාධනයක් ලබාගත හැකි ආකාරයට බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට කටයුතු කළ යුතු වූවද බාහිර කථිකාචාර්යවරයකු වශයෙන් තමාම පත්කර ගනිමින් සිය තනතුරට ලැබෙන වැටුප් හා දීමනාවලට අමතරව පැයක රේටය මත පදනම්ව රු. 1,058,750 ක් සමාලෝචිත වර්ෂය තුළ දේශන ගාස්තු වශයෙන් ලබා ගෙන තිබුණි. | අධ්‍යක්ෂකවරයා අභ්‍යන්තර දේශන පැවැත්වීම වෙනුවෙන් බාහිර කථිකාචාර්යවරයෙකු සඳහා ගෙවනු ලබන ගාස්තු පදනම් කරගෙන ගෙවීම් සිදුකර ඇත්තේ 1987 වර්ෂයේදී ගනු ලැබූ කළමනාකරණ මණ්ඩල තීරණයකට අනුකූලවය. මේ සම්බන්ධයෙන් නිර්දේශයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබෙන තෙක් මෙම ගෙවීම් අත්හිටුවා ඇත. | අදාළ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) 2015 මැයි 15 දිනැති අංක මු.අ 01/2015/01 මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය | චක්‍රලේඛයේ 3 (ආ) වගන්තිය ප්‍රකාරව "දිවයින තුළ ඉටුකළ නොහැකි ආයතනයේ විෂය පථයට අදාළ රාජකාරියක් සඳහා විදේශගත වන නිලධාරියකුට" අනියම් දීමනාද, 4 වන වගන්තිය ප්‍රකාර සංයුක්ත දීමනාද, 6 වන වගන්තිය ප්‍රකාර ප්‍රතිපූර්ණය කළ හැකි වියදම් යනාදිය පමණක් ගෙවිය යුතු වේ. එහෙත් නමුත් විදේශ රටවල් පහක පවත්වා තිබුණු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවල දේශන පැවැත්වීමට ගොස් තිබූ | විදේශ පශ්චාත් උපාධි පාඨමාලාවන්හි දේශන පැවැත්වීමට විශාල ප්‍රයත්නයක් දැරිය යුතු වීම හා ඒ සඳහා ගතවන කාලය සැලකිල්ලට ගෙන, බාහිර දේශකවරුන් සඳහා ගෙවන ගාස්තු අභ්‍යන්තර පූර්ණ කාලීන ඉගැන්වීම් කාර්ය මණ්ඩලයට ද ලබාදිය යුතු බවට 2016 වර්ෂයේදී කළමනාකරණ මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයකට අනුකූලව අදාළ ගෙවීම් සිදුකරන ලදී. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දේශකවරුන් **05** දෙනෙකුට දේශන පැයකට රු. **11,000** ක් බැගින් එකතුව රු. **6,695,750** ක මුදලක් ඔවුන්ගේ නිත්‍ය වැටුප් හා දීමනාවලට අමතරව සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. | විගණන නිරීක්ෂණය කෙරෙහි අවධානය යොමු කරමින් මෙම ගෙවීම් සිදුකිරීම නතර කිරීමට පියවර ගෙන ඇත. |

**2.** මූල්‍ය සමාලෝචනය

---------------------

**2.1** මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. **78,350,275** ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. **136,085,005** ක් විය.ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. **57,734,730** ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පරිහීමට ජාත්‍යන්තර පුහුණු පාඨමාලා ගාස්තු අඩුවීම හා අධ්‍යයන දීමනා වැඩිවීම මෙම පරිහානියට හේතු වී තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය

------------------------

**3.1** මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ රු.**14,113,056** ක පාරිභෝජන භාණ්ඩ මිලදී ගෙන තිබූ අතර ඉන් රු. **8,457,474** ක් හෙවත් සියයට **60** ක් සම්බන්ධයෙන් පමණක් ගබඩා පරිපාලන ක්‍රම අනුගමනය කර තිබුණද ස්ථිර ගබඩා භාරකරුවකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි. වර්ෂය අවසානයේ රු. **4,619,560** ක භාණ්ඩ ඉතිරිව තිබුණු අතර ඉතිරි තොගයෙන් රු. **1,989,715** ක් හෙවත් සියයට **43** ක් මාස **06** කටත් වැඩි කාලයක සිට ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය. පරිභෝජන භාණ්ඩ මිලදී ගැනීම්වලින් රු. **5,635,581** ක් හෙවත් සියයට **40** ක් සම්බන්ධයෙන් ගබඩා පරිපාලන ක්‍රම අනුගමනය නොකර සෘජුවම අදාළ අංශ වෙත යොමු කර පරිගණක සටහනක් පමණක් පවත්වා තිබුණ අතර අදාළ භාණ්ඩ ඉල්ලුම් කිරීම, මිලදී ගැනීම, නිකුත් කිරීම සහ ඉතිරි තොග ශේෂ යනාදිය තහවුරු කර ගැනීමට අදාළ පරිපාලන ක්‍රම කිසිවක් ස්ථාපිත කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නැත. | විධිමත් ගබඩා පාලන පද්ධතියක් හඳුන්වාදී ක්‍රියාත්මක කළ යුතුය. |

3.2 මානව සම්පත් කළමනාකරණය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිවෙලින් 18 ක් හා 26 ක් වූ අතර ඉන් පිළිවෙලින් තනතුරු 03 ක හා තනතුරු 09 ක, පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු පවතින කථිකාචාර්ය තනතුරු පිරවීම සඳහා 2020 වර්ෂයේ අයදුම්පත් කැඳවා නියමිත බඳවාගැනීමේ පටිපාටිය අනුගමනය කරමින් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ii ශ්‍රේණියේ පුරප්පාඩු දෙකක් පිරවීමට බඳවා ගැනීම් සිදු කොට ඇත. පුරප්පාඩුව පවතින ඉතිරි කථිකාචාර්ය තනතුරු සඳහා ඉදිරියේදී බඳවා ගැනීම සිදුකිරීමට පියවර ගනු ලැබේ. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

---

41 තිරසාර සංවර්ධන අරමුණු

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයකින් කටයුතු කර නොතිබුණි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව ආයතනයේ කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද ආයතනය විසින් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා ඒ සඳහා වූ දර්ශකයන් ඉදිරියේ දී සකස් කොට ඒ අනුව ක්‍රියාකිරීමට ඉදිරියේ දී පියවර ගනු ලැබේ. | චක්‍රලේඛය පරිදි තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. |